# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1174 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திகதி / Date – 16/07/2024 පැය 1840

**"පොලිස් ජීවිතාරක්‍ෂක අතරමැදි පුහුණු පාඨමාලාව" හදාරන ලද ජීවිතාරක්‍ෂක නිලධාරීන් 48 දෙනෙකුට සහතිකපත් ප්‍රදානය.**

පොලිස් නාවික කොට්ඨාසයේ පොලිස් ජීවිතාරක්‍ෂක සේවාව මගින් පවත්වනු ලබන (Intermediate Course Of Police Life Saving) "පොලිස් ජීවිතාරක්‍ෂක අතරමැදි පුහුණු පාඨමාලාව" හදාරන ලද ජීවිතාරක්‍ෂක නිලධාරීන් 48 දෙනෙකුට සහතිකපත් ප්‍රදානය කිරීමේ උත්සවයක් ප්‍රජා පොලිස්, සංචාරක හා ආයෝජන දිසාව භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අසංග කරවිට මහතාගේ ප්‍රධානත්වයෙන් 2024.07.16 වන දින පෙරවරුවේ නාරාහේන්පිට පොලිස් ජල ක්‍රීඩා සංකීර්ණයේදී පැවැත්විණි.

2024.05.06 වන දින ආරම්භ කල මෙම පාඨමාලාව 2024.07.16 වන දින සාර්ථකව නිමාවට පත්විය. මෙම පාඨමාලාවේ දක්ෂතම ජීවිතාරක්ෂක නිලධාරියා ලෙස පොලිස් විශේෂ කාර්ය බලකායේ උප පොලිස් පරීක්ෂක බි.එල්.එස් දේශප්‍රිය නිලධාරියා සම්මානය සහ සහතිකපත ලබාගත් අතර දක්ෂතම පිහිනුම්කරු ලෙස පොලිස් කොස්තාපල් 97011 එම්.අයි.එන්.ඩී. සිරිවර්ධන නිලධාරියා සම්මානය සහ සහතිකපත ලබා ගත්තේය.

මෙම අවස්ථාවට සංචාරක හා නාවික දිසාව භාර නියෝජ්‍ය පොලිස්පතිපති සමුද්‍රජීව හා පොලිස් නාවික කොට්ඨාසය භාර අධ්‍යක්ෂ පොලිස් අධිකාරී කමල් ගුණවර්ධන යන මහත්වරුන් ඇතුලු ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් රැසක් සහභාගී විය.

**මෙම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක්**


AIA
POLICE




POLICE



SRI LANKA POLICE
LIFE SAVING
POLICE MARINE DIVISION




ON
G,BOAT RIDING,
EMENT COURSES


POLICE


PMD


POLICE




**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**